සින්දු කටු අකරින් ලියාගන්න දඟලපු හැටි මතක් වෙනවා. ඒවා අයෙත් මොනිටර් ඇක්සයිස් පොත්වල පිළිවෙලකට ලියලා එකතු කරගන්න උත්සාහ කළේ විනෝදාංශයක් විදියට. ගායනා කරන්නත් උත්සාහ නොකළා ම නෙවෙයි. රාග තාල පුරුදු පුහුණු වෙලා ලබන ඉසිඹුවකදී තුරුණු ඇඟිලි තුඩු උත්සාහ කරනවා කනට හුරු ගීතයක් වයලීනයෙන් වයන්නට. බොහොම වෙලාවට ඒ ඇඟිලිතුඩින් තත් හඬවන පිසිකාටෝ ක්‍රමයට.

"තොටුපොළ අයිනේ..."

කනට ඇහෙන හුරුවට පිසිකාටෝ ක්‍රමයට තත් හඬවලා වීරිය කරනවා ස්වර සටහන ලියාගන්නට. විභාග, ආවර්ත සම්පූර්ණ වුණාමයි අළුව අතට ගන්නේ වයලීනයෙන් නියමාකාරව ගීතය වාදනය කරන්න.

"බැරි ද තමන්ගෙ ම තනුවක් නිර්මාණය කරගන්න...?"

හිත පොපියනවා. අම්මා නංගිව නළවනකොට කියපු නැළැවිලි, කුඹුරු වැඩ කාලෙට අහන්න ලැබෙන නෙලුම් කවි, ඉස්කෝලෙට බක්කි කරත්තයේ යනකොට 'කරත්ත සීයා' කියපු ගැල් කවි, වෙල් ඉස්මත්තේ හේන්වලින් රෑට රෑට ඇහුණ පැල් කවි, සීතාවක ගඟේ යන පාරුවලින් ඇහුණ පාරු කවි, බෝගල් පතල බලන්න ඉස්කෝලෙන් ගිය වෙලාවේ ඒ උදවිය කියපු පතල් කවි, හිත වටේට කරකැවෙනවා.

අවිස්සාවේල්ලේ නගර සභා පිට්ටනියේ තිබුණ සංගීත සන්දර්ශනවල නම් අහන්න ලැබුණෙ ම අපරදිග සංගීත මෙවලම්වල නාද රටා. පන්සලේදී පෙරහැරෙදි ඇහුණ සංගීතය ම නෙවෙයි පුවක්පිටියෙ කෝවිල ළඟින් යනකොට ඇහුණෙ. නත්තල් කාලෙට සීතාවක පල්ලියේ ගීතිකා, මුස්ලිම් පල්ලියේ යාතිකා, පින්කම් කාලෙට පිරිත් සජ්ජායනා වගේම අවිස්සාවේල්ල ටවුම වටේට බැඳලා තිබුණ ශබ්ද විකාශන යන්ත්‍රවලින් ඇහුණා.

ඉගෙනගන්න ශිල්පයත්, අහන්න දකින්න ලැබෙන දේත් එකට මුහුවෙලා. අළුව නැතිව නිදහසේ පිසිකාටෝ විදියට තත් හඬවන වෙලාවට ඉබේට ම මතුවුණේ හිත වටේ කරකැවෙන





දේවල් මුසුවුණ ස්වර සංගති. ඒත් ඒවා අමුතු දේවල් විදියට ඒ දවස්වල දැනුණෙ නෑ.

'මවුන්ට් වේවර්ලි' පදික වේදිකා වයලින් - චෙලෝ ප්‍රසංගය මේ වාරේ නැවතුණේ අදහාගන්නත් බැරි තරමේ දර්ශනයකුත් එක්ක.

සුදු මවක් සමඟ සුදු දුවක්!

දවසේ උච්චස්ථානය සටහන් කරමින් ඉර මුදුන්වන්නට ළඟයි. මේපල් අතු රිකිලි නවාගෙන දළුපත් ලෙළවෙන්නේ හිත සැලෙන විදියට ද මන්දා. මධ්‍යාහ්නය වෙන කොට සුළඟත් ටිකක් වේගවත්. උණුසුම්. ඒ උණුසුම් සුසුම්වලින්ද?

හිරිමල් සුදු යෞවනිය ඩෙනිම් කොට කලිසමකින් සැරසීගත් කිඳුරියක් වගෙයි. වසන්තයේ දාහයට ගැළපෙන්නට ළය මඬල විතරක් යන්තමින් වසාගත් දුහුල් ඇඳුම සුළඟත් එක්ක පොර බැදුමක. දිගට වැවුණ රන්වන් දිගු වරල එකට ගොනුකර බැඳ ගන්නට ඇය ලොකු උත්සාහයක. බහාලුමක දමාගෙන ආව වියෝලය කඩපිල් කොනේ තියලා රබර් පටියකින් වරලස කැටි කරගන්න අතරේ ඇයගේ මව තමන් ගෙනාව බේස් වයලීනය කඩ පිලේ බිත්තියට හේත්තු කරනවා.

සුදු පිය - පුතු දෙපල ආයෙමත් වාදනය පටන්ගන්න කලින් මේ අයට බෙදා හදාගන්න දෙයක් තිබුණා. ඒ සුදු මව අරගෙන ආව කෙටි දිවා කෑම වේල. පිය - පුතු දෙපළ දිවා ආහාරයට යොමු වෙද්දී මව් - දියණි දෙපළ තමන් වටා රැස්වෙලා හිටිය රසික වළල්ල රැකගන්න උත්සාහයක. කඩිනමින් තමන්ගේ මෙවලම් බහාලුම්වලින් එළියට අරගෙන සුසර කරගත්තේ වෘත්තීය මට්ටමින්. කොටට කොණ්ඩය කපලා ඉන්න සුදු මවට චාම් බවක් ගෙනාවේ ඇයගේ සරළ කපු ඇඳුම. ඇය හිරිමල් යෞවනයේදී දුව වගේම ඉන්න ඇති. බහාලුමෙන් එළියට එන බේස් වයලීනයේ හැඩය ගත්ත ඇයගේ කවන්ධය මඳක් තරබාරුයි කිව්වොත් වැරදි නෑ. තමන්ගේ කවන්ධයේ හැඩරුව ගත් වියෝලය සුදු දියණියගේ නිකටත්, ළයත් අතර සිර වෙනවා.